**ශීර්ෂය 193 - කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය ද කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශිර්ෂය 193 දරන කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීතී හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම | 2.3 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.7 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ දුර්වලතා | 2.6 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.10 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම | 2.1 |
| | | 2. විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම | 2.2 |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැඳීම්වලට එළඹීම | 2.4 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමපිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්ය අමාත්‍යාංශයේ පරීක්ෂණයට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිනුමේ සඳහන් අඩුපාඩු | 2.8 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | පාඩු හා හානි | 2.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 2.1 කාර්යසාධනය

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 13 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 02 ක්, දෙපාර්තමේන්තු 02 ක්, හා අරමුදල් 01 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණ ව්‍යාපෘති**

---

(i) සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ 2017 වර්ෂය සඳහා ඵලදායිතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 01 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද ඉන් රු. 41,115 ක් පමණක් වැය කර රු.958,885 ක මුදලක් ඉතිරි කර තිබුණි. එය ප්‍රතිපාදන මුදලින් සියයට 96 කි.

(ii) සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ යහපත් රැකියා වාතාවරණයක් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයට රු.3,245,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණි. අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැළැස්මට අනුව එම මුදලින් ඵලදායිතා ප්‍රවර්ධනයට රු.මිලියන 1 ක් ද තොරතුරු තාක්ෂණය වැඩිදියුණු කිරීමට රු.මිලියන 1 ක් ද සැළසුම්, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 1.245 ක් ද වශයෙන් වෙන්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් අමාත්‍යාංශය විසින් උපයෝජනය කර තිබුණේ රු. 558,600 ක් පමණි. ඵලදායීතා ප්‍රවර්ධන සඳහා වෙන් කල මුදලින් සියයට 96 ක් ද තොරතුරු තාක්ෂණ වැඩිදියුණු කිරීමට වෙන්කල මුදලින් සියයට 100 ම ද සැළසුම් පර්යේෂණ හා සංවර්ධනයට වෙන්කල මුදලින් සියයට 58 ක් ද ලෙස ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

(i) අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014, 2015, 2016 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තාවල ජාත්‍යාන්තර කම්කරු සංවිධානය සමඟ එක්ව මාතෘත්ව ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ඇති කිරීම, වෘත්තීය අනතුරු ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීම, අවිධිමත් ආර්ථිකයක් සම්බන්ධ සමාජ ආරක්ෂණ තලයක් ඇති කිරීම සම්බන්ධව කටයුතු කරන බව දක්වා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් ඊට අදාල විය හැකි ජාත්‍යාන්තර කම්කරු සංවිධානය විසින් නිකුත් කළ ගිවිසුම් 13 ක් බලාත්මක කර ශ්‍රී ලංකාවට උචිත වන ආකාරයට ශ්‍රී ලංකාවේ කම්කරු නීති පද්ධතිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ජාත්‍යාන්තර කම්කරු සංවිධානය විසින් 2012 වර්ෂයේ දී "ශ්‍රී ලංකාවේ කම්කරු පරිපාලනය හා පරීක්ෂණය පිළිබඳ අවශ්‍යතාවය" (Technical Memorandum – Sri Lanka Labour Administration and Inspection Need Assessment) යන මාතෘකාවෙන් යුක්තව නිකුත් කළ තාක්ෂණ ලියවිල්ලේ 2 වන වගන්තිය මගින් ශ්‍රී ලංකාවේ කම්කරු පරිපාලනය හා පරීක්ෂාවන් විධිමත් කිරීම සඳහා කම්කරු නිලධාරීන්ගේ වාරික පරීක්ෂණ සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, කම්කරු පරීක්ෂණ සැළසුම් කිරීම ඉතා පුළුල් ලෙස සිදු කිරීම එම කම්කරු පරීක්ෂණ වලින් ලබාගත් ප්‍රතිඵල ක්‍රමවත්ව නියාමනය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම, වෘත්තීය අනතුරු අවම කිරීම සඳහා පියවර ගැනීම, අංක 129 හා 150 දරන

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ගිවිසුම් කඩිනමින් අපරානුමත කිරීම යනාදිය ඇතුලත් නිර්දේශ 17 ක් සඳහන් කර තිබුණි. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අමාත්‍යාංශයේ ප්‍රගතිය ඉතාම අවම මට්ටමක පැවතිණි.

**2.2 ක්‍රියාත්මක කර තිබුණු විදේශ ආධාර ව්‍යාපෘති**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එක්ව රු. මිලියන 2.3 විදේශ ආධාර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති ගිවිසුමේ 3.4 ඡේදය ප්‍රකාරව වැඩසටහන සඳහා දරන ලද වියදම් පිළිබඳ විස්තර ආකෘති D මඟින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත යැවිය යුතුව තිබුණි. වැඩසටහන සඳහා සත්‍ය වශයෙන්. රු.1,375,326 ක් වියදම් කර තිබුණද රු.2,299,389 ක් වියදම් වූ බව ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත දන්වා තිබුණි. ගිවිසුමේ 4.6 ඡේදය ප්‍රකාරව රු.924,063 ක මුදලක් නැවත ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත යැවිය යුතු වුවද එම මුදල ආයතනයේ ආදායමක් ලෙස හඳුනාගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රම අධ්‍යයන ආයතනය හා එක්සත් ජාතීන්ගේ කාන්තා ආයතනය (UN Women) අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව 2016 අප්‍රේල් 1 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාන්තාවන් සේවයේ යෙදීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල යුතු වූ අතර, ඒ සඳහා රු.1,808,282 ක් ලබාදී තිබුණි. නමුත් ව්‍යාපෘති මුදලින් සියයට 72 ක් උපයෝජනය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූලික සමීක්ෂණ කටයුතු නිම වී නොතිබුණි. ඉහත ජාත්‍යන්තර ආයතනයේ මූල්‍ය රීති පිළිපැදීමට ශ්‍රම අධ්‍යයන ආයතනය අපොහොසත් වීම හා මුදල් උපයෝජනයේ අකාර්යක්ෂම බව නිසා එම ආයතනය ලබා දුන් අත්තිකාරම් මුදලින් සියයට 21 ක් පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් රු.558,263ක මුදලක් එම ආයතනය විසින් නැවත ඉල්ලා තිබුණු අතර, 2017 සැප්තැම්බර් 04 දින එම මුදල නැවත ගෙවීමට ශ්‍රම අධ්‍යයන ආයතනයට සිදුවී තිබුණි.

**2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

---

**ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

---

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයිම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 35.38 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 18.90 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂයේදී සඳහා රු.1,060,820 ක වටිනාකමට ඩෙක්ස්ටොප් පරිගණක යන්ත්‍ර 04 ක් සහ ලැප්ටොප් 06 ක් මිලට ගෙන තිබූ අතර ඒ සඳහා 2017 පෙබරවාරි 13 හා 2017 ජූනි 05 දින අවස්ථා දෙකකදී මිල ගණන් කැඳවා තිබුණි. පළමුව සකස් කළ පිරිවිතරය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සකස් නොකිරීම නිසා නැවත මිල ගණන් කැඳවීමට සිදුව තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව පිරිවිතර සමාලෝචනය සහ අනුමත කිරීම කර ප්‍රසම්පාදන කටයුතු සිදුකර යුතු වුවද එසේ සිදු නොවීම මත එකම භාණ්ඩය සඳහා දෙවරක් මිල ගණන් කැඳවීමට සිදුව තිබුණි. තවද මෙම ඩෙක්ස්ටොප් පරිගණක 2017 අගෝස්තු 15 දින අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණ ද එයට අවශ්‍ය මෘදුකාංග ලබා දී තිබුණේ 2017 නොවැම්බර් 06 දින බැවින් මිලදී ගැනීමේ ඇණවුම ඉදිරිපත් කර මාස 04 පමණ ගතවන

තෙක් මෘදුකාංග ලබාදීමට තෝරාගත් ආයතනය අපොහොසත්වීම මත එම පරිගණක මාස 04 කාලයක් නිෂ්ක්‍රීයව පැවතිණි.

**2.4** බැදීම් හා බැරකම්

-------------------

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී මූලධන වැය විෂයයන් 05 ක් හා පුනරාවර්ථන වැය විෂයන් 10 ක් සඳහා සලසා තිබුණු රු.34,401,000 ප්‍රතිපාදනය  රු.6,117,813 කින් ඉක්මවා රු.16,619,144 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**2.5** පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ වාහන 06 ක් අනතුරට ලක්වීමෙන් එකතුව රු.403,632 ක අලාභ හානි සිදු වී තිබුණි. එම අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව ප්‍රාරම්භක පරීක්ෂාව හා පූර්ණ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරීවරයාගේ රාජකාරි කටයුතු සඳහා වෙන් කර දී තිබූ අමාත්‍යාංශය සතු මෝටර් රථයට 2017 අප්‍රේල් 29 දින සිදු වී තිබූ අනතුර සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පොත්වල කිසිදු සටහනක් නොතිබුණි.

**2.6** කළමනාකරණ දූර්වලතා

-----------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වන්දි කොමසාරිස් කාර්යාලයේ පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නියමිත පරිදි භාණ්ඩාගාරයෙන් නොලැබීම හේතුවෙන් වන්දි ලෙස තැන්පත් කළ මුදල් පරිපාලන කටයුතු සඳහා යොදා ගැනීමට සිදු වී තිබුණි. 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනතේ v වන කොටසේ 35 වන වගන්තිය සංශෝධනයක් වශයෙන් 1993 පෙබරවාරි 15 දිනැති අංක 754/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව කම්කරු වන්දි කොමසාරිස් අතැතිව පවතින වන්දි මුදල් අනතුරට ලක් වූ කම්කරුවාගේ යැපෙන්නන්ට ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කළ හැකි බව දක්වා තිබුණි. වන්දි ලෙස සේවායෝජකයින් තැන්පත් කරන ලද රු.23,092,217 ක මුදල වර්ෂය අවසාන වන විට ආයතනයේ වියදම් සඳහා යොදාගෙන තිබූ අතර එම වන්දි මුදල් බැංකු ගිණුමක තැන්පත් කිරීම මත ප්‍රතිලාභීන්ට හිමිවීමට තිබූ පොලී අදායම අහිමි වී තිබුණි. වන්දි මුදල් ආයතනයේ වියදම් සඳහා භාවිතා කිරීම නිසා අදාල ප්‍රතිලාභීන්ට වන්දි ගෙවීම ප්‍රමාද වී තිබූ අතර වන්දි ගෙවීම සඳහා අමාත්‍යාංශයෙන් මුදල් ඉල්ලුම්කර වන්දි ගෙවීමට සිදුව තිබුණි.

(ආ) 2005 අංක 10 දරන කම්කරු වන්දි සංශෝධන පනතෙහි iv වැනි කොටසේ 13(1) වගන්තිය ප්‍රකාරව වන්දි කොමසාරිස් වෙත තැන්පත් කරන ලද වන්දි මුදලක් ඒ සඳහා අයිතිය පවතින පුද්ගලයින් (සාක්ෂි කැඳවා විභාග කිරීමෙන්, පසුව නියෝගයන් හෝ නඩු තීන්දුවක් මඟින් තීරණය කරනු ලැබූ) වෙත බෙදා දීමට කටයුතු කළයුතු වුවත් රු.7,758,225 ක වන්දි මුදල් ප්‍රමාණයක් නිසි ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි. ප්‍රතිලාභීන්ට වන්දි මුදල් හිමිවීමට දීර්ඝ කාලයක් ගතවීමත් සමඟ ඔවුනට හිමිවන මුදලෙහි වර්ථමාන අගය පිරිහීමට ලක්වීමක් වන අතරම වන්දි ලෙසට හිමිවන උපරිම මුදල රු.550,000 කට සීමාවීම නිසා ඔවුනට දැරීමට සිදුවන ගමන් වියදම්, නිතිඥ ගාස්තු හා ඊට අදාල අනෙකුත් වියදම් හා

සැසඳීමේදී ප්‍රතිලාභීන්ට සහනදායී තත්ත්වයක් නොලැබීයාමත් නිරීක්ෂණය විය. වන්දි මුදල් නිදහස් කිරීමේ කාල පමාව වසර 1 සිට වසර 05 ට වැඩි කාලසීමාවක පරාසයක විය.

(ඇ) කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන්දි කොමසාරිස් කාර්යාලයේ බාලවයස්කරුවන් සම්බන්ධ තොරතුරු යාවත්කාලීනව පවත්වාගැනීමේ ක්‍රමවේදයක් නොපැවතුණු බැවින් අදාල බාලවයස්කරුවන්ට හිමි වියයුතු ප්‍රතිලාභ නියමිත කාල සීමාවන් තුල ඔවුන්ට නොලැබීමෙන් කම්කරු වන්දි ආඥා පනතේ අරමුණු ඉටු නොවී පැවතුණු අවස්ථා විය. වයස් පූර්ණත්වයට පත්වීම සහ පදිංචිය සනාථ කර ගැනීමට කිසිදු තොරතුරක් නොමැති වීම යන හේතු මත රු.845,656 වන්දි මුදලක් තැන්පත් කළ ගිණුම් 44 ක් වන්දි කොමසාරිස් කාර්යාලය සතුව පැවතුණි.

(ඈ) 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනතේ VII කෙටසේ 41(2) වගන්තිය ප්‍රකාරව යම් සේවකයෙකුට සිදුවන අනතුරකදී සේවායෝජකයින් වන්දි ගෙවීම් පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීමට හැකි වේ. එම වන්දි මුදල් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත්කිරීම් සිදුකල ද ඒවා නිසි පරිදි බලාත්මක නොවීම මත 2017 දෙසැම්බර් 31 දිනට රු. 11,918,793 ක වන්දි වටිනාකමකින් යුක්ත නඩු ගොනු 47 ක් පැවතිණි. එම ප්‍රතිලාභීන් වෙත වන්දි මුදල් නොලැබීමේ කාල ප්‍රමාදය වර්ෂ 03 සිට වර්ෂ 22 දක්වා විය. මේ හේතුව නිසා වන්දි මුදල් හිමිවිය යුතු යැපෙන්නන්ට ප්‍රතිලාභ නිසි පරිදි නොලැබීයාමක් සිදුවන බව නිරීක්ෂණය විය.

(ඉ) රැකියාවේ යෙදී සිටියදී සිදු වූ මාරක අනතුරු හේතුවෙන් මියගිය සේවකයින්ගේ බාලවයස්කරුවන්ට හිමි වූ වන්දි වෙනුවෙන් ස්ථාවර තැන්පතුවල මුදල් තැන්පත් කිරීම හා වයස් පූර්ණත්වයට පත්වීමත් සමඟ ප්‍රතිලාභ ලබාදීම යන කාර්යන් වන්දි කොමසාරිස් කාර්යාලය විසින් සිදුකරනු ලබයි. වයස් පූර්ණත්වයට පත් වූවත් ප්‍රතිලාභ නිදහස් නොකරන ලද ගිණුම් 329 ක් පැවති අතර එහි වන්දි මුදලෙහි වටිනාකම රු. 10,484,809 කි. එසේම එම වන්දි මුදල් නිදහස් කිරීමේ කාල පමාව වසර 1 සිට වසර 25 දක්වා වූ පරාසයක විය.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 166.9 | 152 | 14.9 | 8.9 |
| | මුලධන | 62.7 | 51.2 | 11.5 | 18.3 |
| | **එකතුව** | **229.6** | **203.2** | **26.4** | **11.5** |
| 2014 | පුනරාවර්තන | 183 | 171.9 | 11.1 | 6.0 |
| | මුලධන | 81.8 | 73.8 | 8 | 9.7 |
| | **එකතුව** | **264.8** | **245.7** | **19.1** | **7.2** |
| 2015 | පුනරාවර්තන | 215.6 | 202.6 | 12.9 | 5.9 |
| | මුලධන | 45.2 | 34.4 | 10.8 | 23.8 |
| | **එකතුව** | **260.8** | **237** | **23.7** | **9.1** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 243.6 | 233.8 | 9.8 | 4.0 |
| | මුලධන | 51.9 | 50.2 | 1.7 | 3.2 |
| | **එකතුව** | **295.5** | **284** | **11.5** | **3.9** |
| 2017 | පුනරාවර්තන | 235.2 | 222.6 | 12.5 | 5.3 |
| | මුලධන | 56.2 | 34.7 | 21.6 | 38.4 |
| | **එකතුව** | **291.4** | **257.3** | **34.1** | **11.7** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් අයවැය ඇස්තමේන්තුව තාත්වික ලෙස පිළියෙල කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට අපේක්ෂිත වියදම් පැන නොනැගීම යන හේතුව මත ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 6,045,387 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ආ) පුනරාවර්ථන වැය විෂයයන් 17 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 12.4 මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 43 ක් සඳහා එකතුව රු.31,604,234 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.23,137,466 පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

අමාත්‍යාංශයට අදාල විෂය අංක 19301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 8.5 | 8.4 | 3.9 | 3.9 | 26 | 15.8 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.290,715 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 4 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි.

**2.9 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1640(iv) ප්‍රකාරව අමාත්‍යාංශ නිලධාරියෙකුට වෙන් කරන ලද නිල රථ සඳහා පෞද්ගලික ගමන්බිමන් වෙනුවෙන් අයකල යුතු ගාස්තු අයකරගෙන නොතිබුණි.

**2.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 96.06 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 12 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 77 | 53 | 24 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 37 | 28 | 09 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 01 | 01 | - |
| (vi) | අමාත්‍ය කාර්ය මණ්ඩලය | 15 | 15 | - |
| | | **153** | **112** | **41** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට කම්කරු අමාතයාංශයේ සේවයේ නියුක්ත ඒකාබද්ධ සේවයේ නිලධාරීන් 8 දෙනෙකු ස්ථාන මාරු නොගෙන සිටින අතර ඔවුන්ගේ සේවා කාලය වර්ෂ 05 සිට වර්ෂ 17 දක්වා පරාසයක විය.

(ආ) අමාත්‍යාංශයේ මුළු සේවක නිලධාරීන්ගෙන් පැය 08 ක් හෝ ඊට අඩුවෙන් පුහුණුව ලද නිලධාරීන් 24 ක් වන අතර කිසිදු ආකාරයේ පුහුණුවක් නොලද නිලධාරීන් සංඛ්‍යාව 50 කි.